**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව - 2024**
**-------------------------------------------**

**01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්**

**1.1 දැක්ම**

උතුරේ ජනතාවගේ අපේක්ෂා තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ළඟා කර ගැනීමට අරමුණු කර ගැනීම.

**1.2 මෙහෙවර**

ජීවනෝපාය නැවත පිහිටුවීම මගින් සේවා හා යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සමඟ උතුරු පළාතේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් සංවර්ධනය.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයෙහි සඳහන් පළාත් සභා ලැයිස්තුවේ හා සමගාමී ලැයිස්තුවේ දක්වා ඇත.

**02. මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 43,103 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රු. මිලියන 40,759 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2,344 ක් හෙවත් සියයට 5.43ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2024 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 38,194 | 37,088 | 1,106 | 2.89 |
| මූලධන | 4,909 | 3,671 | 1,238 | 25.21 |
| **එකතුව** | **43,103** | **40,759** | **2,344.** | **5.43** |

**03. විගණන නිරීක්ෂණ**

පාර්ලිමේන්තුව විසින් ඉහත ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කරන ලද අතර ඒ අනුව එම ප්‍රතිපාදන උපයෝජනය කරන ලදි. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.